# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

**අංක 2453/20 – 2025 සැප්තැම්බර් මස 10 වැනි බදාදා – 2025.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/04/2023/176

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.11.06 දිනැති හා අංක 2409/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.10.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බෙන්තොට, යාත්‍රාමුල්ල, අංක 138/A/3 ලිපිනයෙහි පදිංචි පී. අමිල නිශාන්ත මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, 1 වන මහල ලිපිනයෙහි පිහිටි සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/53/2024 හා 2025.07.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය - IR/COM/04/2023/176

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දීය**

පී. අමිල නිශාන්ත මහතා,
අංක 138/A/3,
යාත්‍රාමුල්ල,
බෙන්තොට.

පළමු පාර්ශ්වය

නඩු අංකය : A/53/2024

සහ

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,
01 වන මහල,
ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

දෙවන පාර්ශ්වය

**ප්‍රදානය**

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය, ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන )පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඇය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරිම සඳහා 2024 ඔක්තෝබර් මස 28 වෙනි දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගයට ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සේවය කරන පී. අමිල නිශාන්ත මහතාට 2011.03.04 දින පැවති සහකාර සාමාන්‍යාධිකාරි මුදල් II ශ්‍රේණියට පත් කිරීමට අදාල සම්මුඛ පරීක්ෂණයේදී ඒ මහතාට අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේද? යන්නත් පිළිබඳව වේ."

ඉහත සඳහන් බෙන්තොට, යාත්‍රාමුල්ල, අංක 138/ A/3 දරන ස්ථානයේ පදිංචි, පී.අමිල නිශාන්ත මහතා, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ (එවකට පොදු පහසුකම් මණ්ඩලයේ) අනියම් ලිපිකරුවකු වශයෙන්, 1999.11.24 දින සේවයට ඇතුළත් වූ බවත් 2000.07.03 දින සිට එම ආයතනයේ III ශ්‍රේණියේ ලිපිකරුවෙකු ලෙස ස්ථිර පත්වීමක් ලද බවත් කියා සිටී.

තවද ඔහු 2002.04.23 දින සිට ගිණුම් අංශයට අනුයුක්තව ගබඩා ලෙජර්, සැලසුම් හා ප්‍රවාහන රාජකාරි ඉටු කරන ලද බවත්, ඊට අමතරව 2011.05.01 දින සිට එවකට පුරප්පාඩුව පැවති ගිණුම් නිලධාරි තනතුරට ද රාජකාරි කළ බවත් ඉන් අනතුරුව 2012.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි "රාජකාරි ඉටු කරන සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්)" II තනතුරට පත් කරන ලද බවත් එසේ රාජකාරි ඉටු කරන පදනමින් සේවයේ යෙදී සිටියදී 2017.10.01 දින සිට සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) (MM-1-1-2006) II ශ්‍රේණියේ ස්ථිර තනතුරට පත් කරන ලද බවත් එනම් 2012.01.05 දින සිට 2017 සැප්තැම්බර් 30 දින දක්වා (රාජකාරි ඉටු කරන පදනම මත) එම

තනතුරේ සේවය කල බවත්, ඒ අතරතුර 2017 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි (2017 සැප්තැම්බර් 27 දිනැතිව) සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) (MM-1-1-2006) II ශ්‍රේණියේ ස්ථිර තනතුරට පත් කරන ලද බවත් ප්‍රකාශ කර සිටී.

ඒ අතර 2010.02.03 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ බඳවා ගැනිමේ පටිපාටිය අනුව ඔහු විසින් අදාල අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබුන අතරතුරදී 2011.03.04 දින පැවති අභ්‍යන්තර උසස්වීම් ලබා දීමේ සම්මුඛ පරික්ෂණයකට ඔහු පෙනී සිටිය ද සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) (MM-1-1-2006) II ශ්‍රේණියේ ස්ථිර තනතුර අමිල නිශාන්ත මහතාට ලබා දිම සඳහා ඔහු විසින් 2013.12.20 දිනැතිව ඉල්ලුම් කරන ලද සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර සඳහා අදාල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සපුරා ඇති නමුත් "විධායක ශ්‍රේණියක" අදාල පළපුරුද්ද සපුරා නොමැති බැවින් "ඔබගේ/(ඔහුගේ) ඉල්ලීම මේ අවස්ථාවේදී ඉටු කල නොහැකි බවට" 2014.04.22 දිනැතිව සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ, සාමාන්‍යාධිකාරී තැන විසින් ලිඛිතව දන්වා ඇත. ඉහත සඳහන් කරන ලද ආයතනයේ ක්‍රියාමාර්ගය එවකට වලංගුව පැවති බඳවා ගැනිමේ පටිපාටියේ "අදාල ක්ෂේත්‍රයේ වසර පහක ( 5 ) පළපුරුද්ද" නැමති සුදුසුකම ආයතනයේ කළමනාකාරිත්වය විසින් වැරදි හා ද්වේශ සහගත ලෙස අර්ථකථනය කර ඇති බවත්, අමිල නිශාන්ත මහතාට එකී කොන්දේසිය පිළිබඳව වෙනස් ආකාරයකටත්,

එම ආයතනයේම ඉංජිනේරු සහකාර තනතුරේ සේවය කරමින් සිටි, විධායක ශ්‍රේණියේ කිසිදු පළපුරුද්දක් නොමැති ඩබ්ලිව්.එච්. සජීව චන්දන සිල්වා නැමති අයෙකුට ඔහු විසින් ඉල්ලුම් කරන ලද සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් හා නඩත්තු) තනතුරට අදාල අධ්‍යාපන සුදුසුකම පමණක් පිළිබඳව සලකා, ඉංජිනේරු තාක්ෂණ උපාධිය ලබා ගෙන වසර 1ක් ගත වීමටත් පෙර, ඔහුට සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් හා නඩත්තු ) ශ්‍රේණියේ තනතුරක් 2018.09.15 දින සිට ලබා දී ඇති බවත් එමගින් ආයතනය එක් එක් පුද්ගලයින්ට වෙනස් අයුරින් සැලකීමක් කර ඇති බවට උදාහරණ සහිතව කරුණු සැල කර සිටී.

මෙම පසුබිම යටතේ, තනතුරට අදාල සියළුම සුදුසුකම් සපුරා තිබියදී, සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ. සේවා කාලය හා පළපුරුද්ද ආදී කරුණු සඳහන් කරමින් එවකට පත්වීම් නිලධාරියා වූ අභ්‍යන්තර සභාපතිවරයා වෙත අමිල නිශාන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත, ඔහු වෙත 2017.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි ලබා දී තිබූ සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර 2013.03.14 දිනට පෙරදාතම් කරන ලද බවත් අමිල නිශාන්ත මහතා කියා සිටී.

මෙම පසුබිම යටතේ, 2013.03.14 දින සිට 2019.09.17 දින දක්වා හිඟ වැටුප් ගෙවීමටද එකී ආයතනයේ සභාපතිවරයා විසින් නියෝග කර තිබියදී එකී හිඟ වැටුප් ගෙවීම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ද්වේශ සහගතව පැහැර ඇති බවත් ඒ සම්බන්ධයෙන් කිහිපවරක්ම කළමනාකාරිත්වයට දැනුම් දී ඇති බවත් අමිල නිශාන්ත මහතා ප්‍රකාශ කර සිටී.

තවදුරටත් කරුණු ඉදිරිපත් කරමින් අමිල නිශාන්ත මහතා බේරුම්කරණය වෙත පහත ඉල්ලීම් පිළිබඳව සැලකර සිටී.එනම්,

A). ඔහුගේ පත්වීම පෙරදාතම් කරන ලද 2013.03.14 දින සිට අදාල වන පරිදි වැටුප් වර්ධක ගෙවා ඔහුගේ වැටුප් සකස් කර තිබුනද, 2013.03.14 සිට 2019.09.17 දක්වා හිඟ වැටුප් ඔහු වෙත මේ වන තෙක් ගෙවා නොමැති වීම හා ආයතනය විසින් ගණනය කර ඇති පරිදි එය රු.310,704.33 කි.

B). ඉහත A හි සඳහන් ඔහුගේ හිඟ වැටුප ගණනය කිරීමේදි, ඔහු වැඩ බැලූ තනතුරේ, වැඩ බැලීමේ දීමනා / අතිකාල ගෙවීම් අඩු කොට ගණනය කර ඇති බවත්, එකී දීමනා අඩු නොකර ගණනය කර ඇති බවත්, එකී දිමනා අඩු නොකර ගණනය කළ විට අදාල වන හිඟ වැටුප රු.659,143.48 ක් බවත්,

C). ඉහත A හා B අනුව, 2013.03.14 සිට 2019.09.17 දක්වා කාලයට අදාල හිඟ වැටුප රු.659,143.48 ක් බවත්,

D). එබැවින් ඉහත සඳහන් රු.659,143.48 ක් වන හිඟ වැටුප ඔහු වෙත ලබා දිය යුතු බවත්ය.

**බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙහිදි පැමිණිලිකාර පාර්ශ්වයත් දෙවන පාර්ශ්වය වන සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකාරිත්වයත් පහත සඳහන් දින වලදි බේරුම්කරණ විභාගය සඳහා කැඳවන ලදි. 2024.12.04, 2025.01.08, 2025.01.29 ,2025.03.11 2025.03.27,2025.06.04 සහ 2025.06.18. ඉහත සඳහන් දිනයන්හිදි දෙපාර්ශ්වයේ කරුණු වාචික සාක්ෂි මගින් මෙන්ම ලිඛිත දේශන මගින්ද ලබා ගත් අතර ඒවා පහත සඳහන් පරිදි විශ්ලේෂණය කර දක්වමි.

**කරුණු විශ්ලේෂණය කිරිම**

01. පැමිණිලිකාර පාර්ශ්වය ඉදිරිපත් කරන අන්දමට, අමිල නිශාන්ත මහතා ඉල්ලුම් කරන ලද සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුර 2011.02.04 දින පැවති අභ්‍යන්තර උසස්වීම් සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ දී ද්වේශ සහගත ලෙස ඔවුනට ලබා නොදුන් බවයි.

02. මෙම පැමිණිල්ලට අදාල කාල සීමාව සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ බඳවා ගැනිමේ පටිපාටි දෙකක් (2) අදාල වී ඇති අතර, අමිල නිශාන්ත මහතාට රාජකාරි ඉටු කිරීමේ පදනම මත, සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරට පත් කර ඇති අතර, පත්කිරීමේ බලධාරියා මෙම අධිකාරියේ සභාපතිවරයා ලෙස බලපැවැත්වුනු බඳවා ගැනිමේ පටිපාටිය ක්‍රියාත්මක වූ කාලය තුළදි එවකට සිටි සභාපතිවරයා විසින් ඔහුගේ පත්වීම ලෙස, සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරට ස්ථිර වශයෙන් 2017.10.01 දින සිට පත් කොට ඇත.

03. ඒ අතරතුරදී පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවක් සලකා බැලූ එවකට සිටි සභාපතිවරයා 2017.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහු වෙත ලබා දුන් තනතුර පැමිණිලිකරුට රාජකාරි ඉටු කිරීමට ලබා දුන් දිනය වන 2013.03.14 දින සිට බලපැවැත්වෙන පරිදි පෙරදාතම් කරන ලද අතර, පෙරදාතම් දිනයේ සිට 2017.10.01 දිනය දක්වා එම කාලයට අදාල එම හිඟ වැටුප් හා දීමනා ගෙවන ලෙසද එවකට පත්කිරීම් බලධාරියා වන සභාපතිවරයා විසින් නියෝග කොට ඇත.

04. එහෙත් පැමිණිලිකරුට අනුව, හිඟ වැටුප් ගෙවන ලෙස කරන ලද එකී නියෝගය ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( මුදල්) විසින් ද්වේශ සහගත ලෙස පැහැර හැර ඇති බව ප්‍රකාශ වේ.

05. තවද පෙරදාතම් කරන ලද පත්වීමට අදාලව පැමිණිලිකරු වෙත වැටුප් වර්ධක ආදිය යාවත්කාලීන කොට මේ වන විටත් ඔහුගේ සේවා කාලයට අදාල වෘත්තිය දීමනාව ද ගෙවන වත්මන් තනතුරට විධිමත් ලෙස අදාල වන වැටුප් පැමිණිලිකරු වෙත අභ්‍යන්තරව ගෙවනු ලබන බව ද නිරීක්ෂණය කරමි.

06. එමෙන්ම පැමිණිලිකරුගේ මෙම ඉල්ලීම සම්බන්ධයෙන්, 2023.05.16 දින පැවති මෙම ආයතනයේ 166 වැනි අධ්‍යක්ෂක මණ්ඩල තීරණය පරිදි, රජයේ ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 12:3 වගන්තියට ප්‍රකාරව සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරේ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් අමිල නිශාන්ත මහතා වෙත දීමනා ගෙවා ඇති බැවින් ඊට අතිරේකව කිසිදු ගෙවීමක් අනුමත කිරීමට නොහැකි බව අධිකාරියේ වැඩබලන සාමාන්‍යාධිකාරි තැන විසින් දන්වා ඇත.

07. මීට අමතරව අමිල නිශාන්ත මහතාගේ සේවා ඉතිහාසය පහත සඳහන් පරිදි සටහන් කරමි.

01). 1999.11.25 දින - අනියම් ලිපිකරු (දෛනික වැටුප් පදනම) පත්වීම

02). 2000.07.03 III පන්තියේ ලිපිකරු තනතුර (ස්ථිර) පත්වීම

03). 2003.07.03 දක්වා පරිවාස කාල සීමාව

04). 2002.05.01 සිට (පරිවාස කාලය තුලම) ආයතනයේ ඉංජිනේරු අංශයේ සිට ගිණුම් අංශයට ස්ථාන මාරු කිරීම (අධීක්ෂණ නිලධාරි - ගණකාධිකාරිවරයා වී ඇත.)

05). 2011.04.21 සිට මුදල් අංශයේ අංශ ප්‍රධානි තනතුරේ රාජකාරි ඉටු කිරීම ( 2012.01.01දක්වා)

06). 2012.01.05 දින සිට සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරේ වැඩ බැලීමට පත්කිරීම.(ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 12.3 වගන්තිය පරිදි වැඩ බැලීමේ දීමනාවක් ගෙවීම.) (බල පැවැත්වෙන දිනය 2012.01.01)

07). 2013.12.20 - අමිල නිශාන්ත මහතා විසින් සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරේ ස්ථිර කරන ලෙසට ඉල්ලීම.

08). 2014.04.21 සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරේ ස්ථිර කිරිමට පැමිණිලිකරු අදාල අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබුනද විධායක ශ්‍රේණියට අදාල පළපුරුද්ද නොමැති බැවින් ස්ථිර කල නොහැකි බව ආයතනයේ සාමාන්‍යාධිකාරි (GM) තැන දැන්වීම.

09). 2017.07.03 රාජ්‍ය ආයතනවල සේවක දිනයක් ප්‍රකාශට පත්කිරීම/ ක්‍රියාත්මක කිරීම අනුව ඉහත කී තනතුරට ස්ථිරව පත් කරන ලෙස හා අදාල දීමනාව ඉල්ලීම.

10). 2019.09.11 - අමිල නිශාන්ත මහතා විසින් තමා සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරට 2013.03.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙරදාතම් කරන ලෙස ඉල්ලීම.

11). 2019.09.17 වගඋත්තරකාර ආයතනය විසින් සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුර 2013.03.14 දින සිට බලපැවැත්වෙන පරිදි පෙරදාතම් කිරිම (එකී තනතුරේ රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ගෙවා ඇති සියළු දීමනා නිශාන්ත මහතාගෙන් ආපසු අයකර ගන්නා බව දැන්වීම)

12). 2023.07.17 පැමිණිලිකරු විසින් ඉහත නියෝගය පරිදි හිඟ වැටුප් ගෙවන ලෙස ඉල්ලීම.

13). 2023.07.25 ආයතනයේ සාමාන්‍යාධිකාරි (වැඩ බලන) විසින් කිසිදු ගෙවීමක් අනුමත කළ නොහැකි බවට ගෙන ඇති අධ්‍යක්ෂක මණ්ඩල තීරණය පැමිණිලිකරු වෙතදැනුම් දිම.

14). සහාධිපත්‍ය අධිකාරිය (වග උත්තරකරු) පැමිණිලිකරුගේ ඉල්ලීම මත සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරට පෙරදාතම් කිරිමේදි එම දිනයේ සිට පත්වීම ස්ථිර කිරිම දක්වා වූ කාලයට අදාලව පැමිණිලිකරු වෙත ගෙවන ලද රාජකාරි ඉටු කිරිමේ සියළු දීමනා ආපසු අයකරනු ලබන බව දැනුම් දිම.

**වගඋත්තරකරු (සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය) ගෙන ඇති ක්‍රියාමාර්ගවල සාරාංශය**

අ). පැමිණිලිකරුගේ සුදුසුකම් හා ඉල්ලීම් හා අභියාචනා මත අනියම් ලිපිකරුවෙකු ලෙස සේවයට ඇතුළත් වූ පැමිණිලිකරුට වගඋත්තරකාර ආයතනය විසින් ඔහු අවසානයේ සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරේ ස්ථිර පත්වීමක් ලබා දිම හා එය ඔහු රාජකාරි ඉටු කිරීමට පත් කිරීම වූ දිනය දක්වා පෙරදාතම් කිරිම දක්වා ආරෝහණ ක්‍රමයට/ධනාත්මක පියවර ගෙන ඇත.

ආ). ආයතනය විසින් පැමිණිලිකරු රාජකාරි ඉටු කරන ලද කාළ සීමාවට අදාලව ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10.3 වගන්තිය අනුව වැඩ බැලීමට/ රාජකාරි ඉටුකිරීමට අදාල තනතුරේ මුලික වැටුපෙහි 1/6 ක් පැමිණිලිකරු වෙත ගෙවා ඇත.

ඇ). වගඋත්තරකාර ආයතනය විසින් පැමිණිලිකරු වෙත ප්‍රදානය කර ඇති සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුර, ආයතනයේ බඳවා ගැනිමේ පටිපාටියේ විධිමත් ක්‍රියාවලියෙන් බැහැරව කර තිබේද යන්න පිළිබඳව කරන ලද මුලික විමර්ශනයේ නිර්දේශ අනුව පැමිණිලිකරුගේ එකී පත්වීම බල රහිත කිරීමට නිර්දේශ කර තිබුන ද ඉන් පැමිණිලිකරුට ආර්ථික හා සමාජමය වශයෙන් ඇති විය හැකි අගතිය පිළිබඳව සානුකම්පිතව පැමිණිලිකරුට පමණක් පෞද්ගලික වන සේ එකි තනතුරේ සේවය කිරීමට ඉඩදීම.

ඈ). පැමිණිලිකරුට 2017.10.01 දින සිට මේ දක්වා වැටුප් පිළිබඳ ගැටළුවක් නොමැති අතර 2012.01.02 සිට 2017.10.01 දින දක්වා වූ අවුරුදු 5යි, මාස 8 යි දින 29 ක් පිළිබඳ හිඟ වැටුප් පිළබඳ ගැටළුවක් ඇත.

**ආරාවුලට අදාලව විසඳිය යුතු ප්‍රධාන ගැටළුව**

පත්වීම පෙරදාතම් කිරිමේදි, පෙරදාතම් කිරීම බලපැවැත්වෙන දිනයේ සිට එය ක්‍රියාත්මක කරන ලද දිනය දක්වා වූ කාලයට එකී තනතුරේ රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ගෙවන ලද සියළු දිමනා ආපසු අය කළ යුතුද?

**පිළිතුර**

අදාල නිලධාරියාට රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ඊට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දීමනාවක් ගෙවා ඇති බවත්, පෙරදාතම් කිරිමේදි එම තනතුරට අදාල වූ නියමිත වැටුප මේ වන විට ගෙවා ඇති වැඩ බැලිමේ/ රාජකාරි ඉටු කිරීමේ දීමනා අඩු කර ගෙවීම අසාධාරණ නොවේ.

**ප්‍රදානය**

මෙම කරුණු සලකා බැලිමේදි පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාලව, වගඋත්තරකාර ආයතනයේ කළමනාකාරිත්වය විසින් පැමිණිලිකරුගේ හැකියා ධාරිතාවෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් ආයතනයේ පියගැට පෙළකින් යන ආකාරයට ආරෝහණ ක්‍රමයට තනතුරු වලට පත්කර ඇති බවත්, ඔහුගේ සේවා ඉටු කිරීම, කාර්යක්ෂමතාවය, විනය කරුණු වැනි, තනතුරට සෘජුවම බලපානු ලබන සෘණාත්මක සාධක කිසිවක් පැමිණිලිකරු වෙතින් දෘශ්‍යමාන වූ බවක් නිරීක්ෂණය නොවේ.

පැමිණිලිකරු සඳහන් කරන අන්දමට 2011.03.04 දින පැවති සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) II ශ්‍රේණියට පත් කිරීම සඳහා අමිල නිශාන්ත මහතාගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ගැටළුවක් මතු නොවුණද එම තනතුරට අදාල ක්ෂේත්‍රයේ, එනම් ගිණුම් අංශයේ වසර 05 ක පළපුරුද්දක් නොතිබූ බව මේ පිළිබඳව පශ්චාත් විමර්ශනයක් ලෙස ආයතනය විසින් කරන ලද පරීක්ෂණයේ නියෝගයක් ලෙස නිරීක්ෂණය කරමි.

එය වගඋත්තරකාර ආයතනයේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද යන කොන්දේසි මත නිවැරදි බව පෙනී යයි. එහෙත් පැමිණිලිකරු කියා සිටින්නේ ඔහුට විධායක ශ්‍රේණියේ අවුරුදු 05ක පළපුරුද්දක් නොතිබූ නිසා ඔහු වෙත තනතුර දිය නොහැකි බව වගඋත්තරකාර ආයතනයේ කළමනාකාරිත්වය ප්‍රකාශ කළ බවයි.

එහෙත් වගඋත්තරකාර ආයතනය එම ප්‍රකාශය ප්‍රතික්ෂේප කරයි. ඒ අනුව ඔහු සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ රාජකාරි ඉටු කිරීමේ කාලය අවුරුදු 05 සම්පූර්ණ වූ පසුව ඔහුට එම තනතුර ස්ථිර කිරීම මගින් එහි අවශ්‍යතාවය සාධාරණීකරණය කර ඇති බව ද නිරීක්ෂණය වේ.

මෙහිදී පැමිණිලිකරු විසින් 2013 වර්ෂයෙදී, ඔහු විසින් සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුර සඳහා තමාව පත් කරන ලෙස කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනය විසින් පැමිණිලිකරුගේ සේවා තත්වයට සමාන වෙනත් පුද්ගලයෙකු වෙත එකී පුද්ගලයා විසින් ඉල්ලුම් කරන ලද (පැමිණිලිකරු විසින් ඉල්ලුම් කල තනතුරට සමාන) තනතුරක් සඳහා පත් කිරීම මගින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇතැයි යන චෝදනාව පිළිබඳ විභාග කිරීම මෙම බේරුම්කරණයේ විෂය පථයට අදාල නොවන කරුණක් බැවින් එය ඒ සඳහා අදාල අධිකරණ බලය (JURISDICTION) ඇති ඉහල අධිකරණයකට යොමු කල යුතු කරුණක් බවද සඳහන් කරමි.

ඒ අතර ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියෙන් බැහැරව පත් කරන ලද පත්වීම් කිහිපයක් පිළිබඳව විමර්ෂණයක නිර්දේශයක් ලෙස එම පත්වීමට අදාලව එවකට සිටි සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරිවරයා විසින් අමිල නිශාන්ත මහතාට ලබා දුන් පත්වීම බල රහිත කොට ඔහු දැරූ කණිෂ්ඨ තනතුරට ආපසු පත් කිරීම ක්‍රියාත්මක නොකොට පැමිණිලිකරුගේ ආර්ථික හා සමාජීය තත්වය පිළිබඳව සානුකම්පිතව සලකා බලා ඔහුට පෙරදාතම් කොට ලබා දුන් තනතුර ස්ථිරව ලබා දීමට වගඋත්තරකාර ආයතනය ගෙන ඇති තීරණය ද බේරුම්කරණයේ අවධානයට ලක්විය.

එබැවින් පැමිණිලිකාර අමිල නිශාන්ත මහතාගේ සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුර 2012.01.02 සිට පෙරදාතම් කිරීම තහවුරු කොට 2012.01.02 දින සිට 2017.10.01 දක්වා කාලයට අදාල හිඟ වැටුප් ගණනය කොට ඉන් රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ඔහුට ගෙවන ලද දීමනාව අඩු කොට ගෙවීමට එකඟ වී ඇති මුදල වන රු.310,704.33 (රුපියල් තුන් ලක්ෂ දස දහස් හත්සිය හතරයි ශත තිස් තුනක් ) ක මුදල පැමිණිලිකරු වෙත හිඟ වැටුප් ලෙස ගෙවීම සාධාරණ හා යුක්ති සහගත බවට තීරණය කරමි.

ඒ අනුව මෙම ප්‍රදානය ගැසට් ගත වී මසක් ඇතුළත ඉහත පරිදි ගෙවීම් සිදු කර ඒ බව දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කල යුතු බවට නියම කරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**කේ. ඒ. එස්. කීරගල,**
බේරුම්කරු.

2025 ජුලි මස 08 වැනි දින.

EOG 09 - 0080

---

මගේ අංකය : IR/COM/03/2022/123

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.10.24 දිනැති හා අංක 2355/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 දින දරන නියෝගයෙන්, එක්

පාර්ශ්වයක් වශයෙන් වල්පිට, අගලෙගෙදර, අංක 303 ලිපිනයෙහි පදිංචි ටී. එම්. ලංකාගේ මයා සහ කොළඹ 10, ටී.බී. ජයා මාවත, "ජනවතු පියස", අංක 320 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/56/2023 හා 2025.08.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ - බේරුම්කරණය හා කාර්මික අධිකරණ ශාඛාව**

ටී. එම්. ලංකාගේ මයා,
නො.303, අගලෙගෙදර,
වල්පිට.

පළමු පාර්ශ්වය

යොමු අංකය : IR/COM/03/2022/123
නඩු අංකය : A/56/2023

සහ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.
නො.320
" ජනවතු පියස " ටී.බී. ජායා මාවත.
කොළඹ 10.

දෙවන පාර්ශ්වය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර අමාත්‍යවරයා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමගින් කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2023.10.18 වන දින බේරුම්කරු වශයෙන් එම්. එම්.අයි.ආර්.ඊ.ජයතිලක වන මා පත් කර ඇත.

මෙම කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කර ඇත.

"ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ සේවය කළ ටී. එම්. ලංකාගේ මහතා 1997 මාර්තු මස ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවයට අන්තර්ග්‍රහණය කර ඇති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2020.06.02 දිනැති ලිපිය අනුව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ii පන්තියට 1993.07.01 දින සිට උසස් කර ඇත. ටී. එම්.ලංකාගේ මහතාට උක්ත උසස්වීම අනුව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් කළ යුතු යාවත්කාලීන කරවීම නොකිරීම මගින් ටී. එම්. ලංකාගේ මහතාට අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තිය අනුව අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ඔහු විසින් පනවන ලද නියෝග අංක 21(1) හා 21(2) මගින් දක්වා ඇති පරිදි ආරාවුලට විෂය වී ඇති සම්පූර්ණ කරුණු සම්බන්ධයෙන් වූ විස්තර ප්‍රකාශයක් දෙපාර්ශ්වයෙන්ම ලබා ගතිමි. අනතුරුව ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය වෙතින් ලද විස්තර ප්‍රකාශයට පිළිතුරු ලෙස වූ ප්‍රති උත්තර ප්‍රකාශයක් දෙපාර්ශ්වය වෙතින් වෙන වෙනම ලබා ගතිමි.

2003.11.08 වන දින දෙපාර්ශ්වය කැඳවා ආරාවුල නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් යම් එකඟතාවයක් ඇති කර ගෙන ආරාවුල සමථයකට පත් කර ගැනීම කෙරෙහි දෙපාර්ශ්වයේ එකඟතාවයක් ඇත්දැයි පරීක්ෂා කර බැලුවෙමි. එවැනි එකඟතාවයක් පෙන්නුම් නොකරන ලද අතර බේරුම්කරණය සඳහා වූ සාක්ෂි විභාගය සඳහා ඉදිරි පියවර ගැනීමට තීරණය කළෙමි. ඒ අනුව මීලඟ සාක්ෂි විභාගය 2023.11.15 වන දිනට නියම කළෙමි.

සාක්ෂි විභාග කිරීම 2023.11.08 වන දින සිට 2024.04.22 දින දක්වා පවත්වන ලද අතර අවසාන ලිඛිත දේශන 2024.05.20 දිනට ලබා දෙන ලෙස දෙපාර්ශ්වයට නියම කළෙමි.

කාර්මික ආරාවුල් පනතේ නියෝග අංක 21(1) හා 21(2) අනුව ආරාවුල ඇති වීමට හේතු වූ කාරණා පිළිබඳව දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ හා ප්‍රතිඋත්තර ප්‍රකාශයන් ද ඉදිරිපත් වූ වාචික සාක්ෂිද ලේඛනමය සාක්ෂි ද විශ්ලේෂණය කර සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් ලබාදීමට කටයුතු කළෙමි.

1989.09.01 දින පැමිණිලිකරු හෙවත් පළමු පාර්ශ්වය ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 3 වන පන්තියේ 11 ශ්‍රේණියේ කථිකාචාර්යවරයෙකු ලෙස කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවයට බඳවා ගෙන ඇති අතර කාර්මික විද්‍යාලයන්හි යාන්ත්‍රික ඉංජිනේරු විෂය පිළිබඳව කථිකාචාර්යවරයෙකු ලෙස රැකියාව ආරම්භ කර ඇත. අදාල බඳවා ගැනීමේ පටිපාටියට අනුව අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 2 වන පන්තියේ කථිකාචාර්ය තනතුරට උසස් වීමේ අවස්ථාව පැවති බව සාක්ෂි විභාගයේදී අනාවරණය විය.

1996.05.01 දින සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පිහිටුවීමෙන් පසු එතෙක් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ කාර්මික විද්‍යාල මගින් පවත්වා ගෙන යන ලද සියළුම උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම සඳහා අළුතින් පිහිට වූ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට පැවරුනි. ඒ හේතුවෙන් කාර්මික විද්‍යාලවල එම ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යාමට අනුයුක්තව සිටි සේවක පිරිස් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අනුයුක්ත කර යැවීමටත් පසුව ඔවුන් එම ආයතනයට අන්තර්ග්‍රහණය කර ගැනීමටත් පියවර ගෙන ඇත. ඊට අකැමැති වූ සේවකයින්ට විශ්‍රාම යමේ අවස්ථාව ලබා දී ඇත. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින් තමන් කලින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටි තනතුරට අනුරූප තනතුරුවල පිහිටුවා ඇත. මේ වන විට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවකයින් සඳහා තනතුරු ශ්‍රේණි හා ඊට අදාල වැටුප් පරිමාණයන් නිශ්චය කර නොතිබුණි. එබැවින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 1997.01.01 දින වන විට ලබමින් සිටි වැටුපට එම වැටුපෙන් 25%ක ප්‍රතිශතයක්ද එකතු කර දෙපාර්තමේන්තුවේ සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයට අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින්ට වැටුප් ගෙවා ඇත. ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන තාක්ෂණ ආයතනයේ තනතුරු ශ්‍රේණි හා වැටුප් පරිමාණ අළුතින් ඇති කරන තෙක් ඒ අනුව වැටුප් ගෙවා ඇත.

ටී. එම්. ලංකාගේ මහතා ඇතුළු ඉංජිනේරු උපාධිධාරි කථිකාචාර්යවරුන් 1997.03.01 දින වන විට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අවුරුදු 8 ½ ක් පමණ සේවය කර තිබූ අතර අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන්ට කාර්මික අධ්‍යාපන සේවයේ 3 පන්තියේ සිට 2 පන්තියට උසස් වීමට හිමිකම ලැබිය හැකිව තිබුනි. එලෙස 2 පන්තියට උසස්වීම ලබා තිබුනි නම් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඊට අනුරූප තනතුර වූ 1 ශ්‍රේණියේ කාථිකාචාර්ය තනතුර ලැබීමට හැකියාව තිබුනි. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 3/97 අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාල අංක:97/0007/108/003 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ඔවුන් 1997.03.01 වන දින ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කිරීමට පියවර ගෙන තිබීම හේතුවෙන් කාර්මික අධ්‍යාපන සේවයේ 3 වන පන්තියේ සිට ඔවුන්ට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 11 ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු ලබා ගැනීමට සිදු විය. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ තමන් දරමින් සිටි තනතුරට අනුරූප තනතුරකට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කරනු ලැබීම ඊට හේතුව වේ. දෙවන පාර්ශ්වයේ අවසාන ලිඛිතදේශන වල 15 සහ 41 වන පරිච්ඡේදයන්හි පැහැදිලිව ඒ බව දක්වා ඇත.

තවද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරුන්ගේ ශ්‍රේණි පිළිබඳව සාක්ෂි විභාගයේදී බේරුම්කරු විසින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) වෙතින් හා දෙවන පාර්ශ්වයේ පාලන සහකාරවරියගෙන් ප්‍රශ්න කරන ලදී. කාර්මික විද්‍යාලවලට කථිකාචාර්යවරු බඳවා ගන්නා ආකාරය පිළිබඳ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙතින් ප්‍රශ්න කරන ලද අතර,

ප්‍ර : කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේ ශ්‍රේණියේ සිට ශ්‍රේණි උසස්විම් අනුපිළිවෙල කුමක්ද?

පි : මුලින්ම 3 පන්තිය. ඊට පසුව 2 පන්තිය, පසුව පළවන පන්තිය 1986 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථාව අනුව

(2024.02.07 වන දින සාක්ෂි සටහන් පිටු අංක :12, 13)

එම අවස්ථාවේදී ම බේරුම්කරු විසින් දෙවන පාර්ශ්වයේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාලන සහකාර ප්‍රියන්ති ගුණරත්න යන අයගෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ කථිකාචාර්යවරුන් බඳවා ගන්නා ආකාරය පිළිබඳ ප්‍රශ්න කරයි.

ප්‍ර : කථිකාචාර්යවරු පත් කිරීමේදී ආරම්භක පත්වීමේ ශ්‍රේණියේ සිට ඉහළට ශ්‍රේණිය කුමක්ද?

පි : 2 පන්තිය, 1 පන්තිය ඉන්පසුව ජොෂ්ඨ කථිකාචාර්ය

(2024.02.07 වන දින සාක්ෂි සටහන් පිටු අංක 13)

ඒ අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට සේවකයින් අන්තර්ග්‍රහණය කිරීමේදී එම ආයතනයේ අනුරූප තනතුරෙහි පිහිටු විය යුතුය. පහත සටහනේ ඊතල සලකුණ මගින් පිහිටුවිය යුතු අනුරූප නව තනතුර පෙන්වා ඇත.

| **ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ දරමින් සිටි තනතුර** | | **ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතතනයේ පිහිටු විය යුතු තනතුර** |
|---|---|---|
| 3 වන පන්තියේ කථිකාචාර්ය | ⟶ | ii පන්තියේ කථිකාචාර්ය |
| 2 වන පන්තියේ කථිකාචාර්ය | ⟶ | i පන්තියේ කථිකාචාර්ය |
| 1 වන පන්තියේ කථිකාචාර්ය | ⟶ | ජොෂ්ඨ කථිකාචාර්ය |

ටී. එම්. ලංකාගේ මහතා ඇතුළු තවත් කථිකාචාර්යවරුන් 07 දෙනෙකු 1997.03.01 දින සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 11 ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ලෙස අන්තර් ග්‍රහණය කරද්දී තිදෙනෙකු ජොෂ්ඨ කථිකාචාර්යවරුන් ලෙස අන්තර්ග්‍රහණය කර ඇත.

ටී. එම්. ලංකාගේ මහතා ඇතුළු 111 පන්තියේ කථිකාචාර්ය වරුන් හත් දෙනෙකුට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 11 පන්තියේ කථිකාචාර්යවරුන් ලෙස පත්වීමට සිදු වුයේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කරන ලද දිනය වූ 1997.03.01 දිනය වන විට තම සේවා කාලය වසර 10ක් සම්පූර්ණ කිරීමට තවත් අඩුව තිබුන වසර 1 1/2 ක පමණ කාලයක් සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 11 පන්තියට පත්වීමට නොහැකි ව 111 පන්තියේ රැඳී සිටීම නිසාය.

තමන්ට සිදු වූ මෙම අසාධාරණය නිසා තමන්ගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවට තීරණ කර සුදුසු නිර්දේශ ලබාදීම සඳහා මෙම කථිකාචාර්යවරුන් විසින් 1998.02.11 වන දින අංක :HR /266/98 යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ගොනු කර ඇත. මානව හිමිකම් කොමිසම මෙම පැමිණිල්ල දීර්ඝ කාලයක් තිස්සේ විමර්ශනය කිරීමෙන් අනතුරුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් කරන ලද මූලික නොසලකා හැරීමේ හේතුවක් මත පදනම් ව මෙම පහළ මට්ටමේ තනතුරු ලැබීමට හේතු වී ඇති බව තීරණය කර ඇත.

එම වරද නිවැරදි කිරීම සඳහා අවශ්‍ය තීරණවලට එළඹීම වෙනු වෙන් අදාල පාර්ශ්ව සියල්ලගේ සහභාගිත්වයෙන් කමිටුවක් පත් කර කමිටුව මගින් ගන්නා ලද තීරණ මානව හිමිකම් කොමිසම වෙතදන්වන ලෙස එම කොමිසම විසින් වෘත්තීය පුහුණු හා කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත.

එම කමිටුවේ වාර්තාව ලැබීමෙන් පසුව මානව හිමිකම් කොමිසම විසින් තීරණය කරන ලද්දේ කමිටුව විසින් මෙම කථිකාචාර්යවරුන්ගේ ගැටළුව නිසි පරිදි සාකච්ඡා කර නොමැති බවකි.

නමුත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක : ආයතන /4/4 හා 2003.01.31 දිනැති ලිපිය මගින් මානව හිමිකම් කොමිසම වෙත දන්වා ඇත්තේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කථිකාචාර්ය වරුන්ගේ ශ්‍රේණි උසස්වීම් කිරීමෙන් පසු ඒ බව තම ආයතනයට දන්වන්නේ නම් ඊට අනුරූප තනතුරුවල ඔවුන් පිහිටු

වීමට පියවර ගන්නා බවකි. එනම් නිර්මාණය වී ඇති විෂමතාවයට පාදක වී ඇති මූලික කරුණු නිවැරදි කිරීම සඳහා පැමිණිලිකරුවන් ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ii පන්තියට උසස් කර අනතුරුව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට දැන්වීමේ වගකීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වගකීමක් බව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පෙන්වා දී ඇති බව මානව හිමිකම් කොමිසමේ 2009.08.26 දිනැති අවසාන වාර්තාවේ දක්වා ඇත.

මෙම තත්වය යටතේ මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාවේ අවසන් වශයෙන් නිර්දේශ කර ඇත්තේ පහත සඳහන් පරිදි වේ.

> “මෙම කථිකාචාර්යවරුන් කාර්මික අධ්‍යාපන සේවයේ 11 පන්තියේ කථිකාචාර්ය ධූර වලට පෙරදාතම කර ඔවුන්ගේ පත්වීම් උසස් කර එම උසස්වීම් නියමිත දිනට ලබාදීම මත වැටුප් හා දීමනාද සහිතව නියමිත තනතුර පෙරදාතම කර ලබා දෙමින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කළ යුතුය.”

ඒ අනුව තමන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද කාලය තුල මෙම ශ්‍රේණි උසස්වීම් පෙරදාතම කර ලබා දීම සඳහා තමන්ගේ පත්වීම් බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරමින් 2009 වර්ෂයේ සිටම කටයුතු කිරීමට මෙම කථිකාචාර්යවරුන් විසින් පියවර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක: PSC/APP/06/305/2013 හා 2020.06.02 දිනැති ලිපිය මගින් ටී. එම්. ලංකාගේ මහතා 1993.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 11 පන්තියට (විශේෂ සේවක සංඛ්‍යාවේ) උසස් කර ඇති බව දන්වා ඇත. එම ලිපියේ පිටපත් නිපුණතා සංවර්ධන රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ටී. එම්. ලංකාගේ මහතාගේ පෞද්ගලික ලිපි ගොනුව වෙත යොමු කර ඇත.

එම ලිපියට අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ටී. එම්. ලංකාගේ මහතා, ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 11 පන්තියට ( විශේෂ සේවක සංඛ්‍යාවේ) උසස් කර සියළු හිඟ වැටුප් ගෙවා ඇත.

2024.01.10 වන දින සාක්ෂි විභාගයේදී බේරුම්කරු විසින් පළමු පාර්ශ්වයෙන් ප්‍රශ්න කිරීමේදී 1993.07.01 දින සිට 1997.03.01 දක්වා වූ කාලය සඳහා සියලු හිඟ වැටුප් ගෙවා ඇති බව පිළිගෙන ඇත.

ප්‍ර : තමුන්ට 1993 ඉඳලා දෙවන ශ්‍රේණිය දිලා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් දුන්නාට පස්සේ කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු ඇරියස් දුන්නාද ?

පි : ඔක්කොම ගෙව්වා.

(2024.01.10 දින සාක්ෂි සටහන්වල පිටු අංක : 2)

ටී. එම්. ලංකාගේ මහතා වෙත යොමු කර ඇති කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක:DTET/04/14/RL/2 හා 2020.08.24 දිනැති වැටුප් පරිවර්තන ලිපියේ පිටපතක් (P10 ලෙස ලකුණු කර ඇත) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ද යොමු කර ඇත.

ඊට අමතරව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක:Admin/PF/05/40 හා 2020.09.23 දිනැති ඔහුගේ ලිපිය මගින් කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක : DTET/04/14/02 හා 2020.10.07 දිනැති ඔහුගේ ලිපිය (P9 ලෙස ලකුණු කර ඇත) සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක : PSC/APP/6/305/2013 හා 2020.06.02 දිනැති ලිපියෙහි පිටපතක්ද (පි3 ලෙස ලකුණු කර ඇත.) “අවශ්‍ය කටයුතු සඳහා” යනුවෙන් සළකුණු කර ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත.

සාක්ෂි විභාගයේදී දිගින් දිගටම දෙවන පාර්ශ්වය විසින් කියා සිටියේ තමන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ ඉහත ලිපිය ලබා දී නැති බැවින් ටී.එම්.ලංකාගේ මහතාට ලබා දී ඇති උසස්වීමට අනුරූප තනතුරෙහි පිහිටුවීමට නොහැකි වූ බවකි. නමුත් ඉහත ඡේදයේ සඳහන් කරන ලද පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය සහ ඊට අනුව ටී. එම්. ලංකාගේ මහතාගේ වැටුප් පරිවර්තනය කරන ලද ලිපියද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට යවා ඇති බව අනාවරණය වේ.

මෙලෙස අවශ්‍ය තොරතුරු සියල්ල තමා වෙත ලැබී තිබියදී ටී. එම්. ලංකාගේ මහතාගේ උසස්වීමට අනුව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් ඒ මහතාගේ තනතුර යාවත් කාලීන නොකිරීම බරපතල වරදකි. මෙම යාවත් කාලීන කිරීමට කිසිවෙකුගේ

නියෝගයක් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත ලබාදීම අනවශ්‍යය. අවශ්‍ය වන්නේ කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ටී. එම්. ලංකාගේ මහතාගේ තනතුර උසස් කළ බවට වූ දැන්වීම පමණි. ඒ අනුව තම ආයතනයද ඒ මහතාගේ තනතුර යාවත් කාලීන කිරීමට වගකීමෙන් බැඳී සිටී. (ඉහත 18 වන ජේදයේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මානව හිමිකම් කොමිසමට ලබා දී ඇති එකඟතාවය)

අදාළ නොවන තර්ක ඉදිරිපත් කරමින් දැනටමත් විශ්‍රාම ලබා ඇති විශ්‍රාමික සේවකයෙකුගේ තනතුර යාවත්කාලීන කොට හිඟ වැටුප් ලබා නොදී කල් මැරීම අසාධාරණ හා අයුක්ති සහගත ක්‍රියාවක් මෙන්ම සදාචාරාත්මක නොවන ක්‍රියාවකි.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාලක සභාව විසින් එහි 193 වන පාලක සභා රැස්වීමේදී රාජ්‍ය සේවා කොමිසන් සභාවේ තීරණයට අනුව ටී. එම්. ලංකාගේ මහතාගේ තනතුර උසස් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. (දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත දේශනයේ 9 වන ජේදය) කිසිඳු හේතු දැක්වීමකින් තොරව කරන ලද එම ප්‍රතික්ෂේප කිරීමට ගත් තීරණය අතාර්කික හා අත්තනෝමතික තීරණයක් වන අතර ටී. එම්. ලංකාගේ මහතා සම්බන්ධයෙන් කරන ලද අසාධාරණ හා අයුක්ති සහගතලෙස කටයුතු කිරීමකි.

බේරුම්කරණයට ඉදිරිපත් ව ඇති මෙම ආරාවුල උද්ගත වී ඇත්තේ ඉහත ප්‍රතික්ෂේප වීම පාදක කර ගනිමිනි. උද්ගතව ඇති මෙම ආරාවුල නිරවුල් කර ගැනීම සඳහා පළමු පාර්ශ්වය විසින් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති අතර නැවතත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට පසුව පත්ව පැමිණි අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ද අභියාචනයක් කර ඇත. ඔහුගේ තීරණය වී ඇත්තේ පළමු පාර්ශ්වය විසින් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති නිසා එම පැමිණිල්ල සඳහා තීරණයක් ලැබෙන තුරු තමන්ට කිසිඳු පියවරක් ගත නොහැකි බවයි.

දෙවන පාර්ශ්වයේ අවසාන ලිඛිත දේශනයේ 22 හා 23 වෙනි ජේදවලින් කියවෙනුයේ පැමිණිලිකරු 1993.07.01 දින සිට ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ii වන පන්තියට උසස් කිරීම පිළිබඳ ව වූ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය හා එම උසස් වීම අනුව වැටුප් සකස් කොට හිඟ වැටුප් ගෙවීම් පිළිබඳ වූ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කිරීමට තමන් බැඳී නොමැති බවකි. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 3/97 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව අංක 97/0007/108/003 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින් අනුරූප තනතුරුවල පිහිටු වීමට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය බැඳී සිටී. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද අවසාන ලිඛිත දේශනයේ 39,40,41 ජේද වලින් ඒ බැව් පිළිගෙන ඇත.

බැඳී ඇති එම වගකීම අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 1997.03.01 දින සිට අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින් විසින් අන්තර්ග්‍රහණයට පෙර දරමින් සිටි තනතුර වැරදි සහගත බව අනාවරණය වීමෙන් පසු නිවැරදි තනතුරට උසස් කිරීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පසුකාලීනව තීරණය කිරීමෙන් පසුව එම සේවකයින් නිවැරදි කරන ලද අනුරූප නව උසස් තනතුරුවල පිහිටුවා හිඟ වැටුප් ගෙවීමට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් කටයුතු කළ යුතුව ඇත.

1998.02.11 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි කර ඇති අතර මානව හිමිකම් කොමිෂම විසින් එම පැමිණිල්ල විමර්ශනය කර අවසන් නිර්දේශ ලබා දෙන ලද්දේ 2009.08.26 දින දීය. එදින සිට පැමිණිලිකරු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මානව හිමිකම් කොමිෂන් සභා නිර්දේශ ඉදිරිපත් කරමින් තමාට සිදු වී ඇති අසාධාරණය ඉවත් කිරීම සඳහා එම කොමිසම මගින් යෝජනා කර ඇති පරිදි කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තිය දක්වා පෙරදාතම කරමින් තමාගේ උසස්වීම ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. රාජ්‍ය සේවා කොමිසම විසින් දීර්ඝ කාලයක් මේ පිළිබඳ අධ්‍යනය කර 2020.06.02 දින රාජ්‍ය සේවා කොමිසමේ ලේකම්ගේ අංක PSC/APP/6/305/2013 දරන ලිපිය මගින් තීරණය කර ඇත්තේ පැමිණිලිකරු 1993.07.01 දින සිට කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ කථිකාචාර්ය තනතුරට උසස් කිරීමටය. ඒ අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරු කාර්මික අධ්‍යාපන සේවයේ ii පන්තියට උසස් කර හිඟ වැටුප් ද ගෙවා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2020.08.24 දිනැති වැටුප් පරිවර්තන ලිපිය මගින් නිසි පරිදි දැනුවත් කර ඇත. ඊට අමතරව 2020.10.07 දින රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ඉහත ලිපියේ පිටපතක්ද අවශ්‍ය කටයුතු සඳහා දෙවන පාර්ශ්වයට යවා ඇත.

නමුත් දෙවන පාර්ශ්වය විසින් තම වගකීම ඉටු කිරීමට අසමත්ව ඇත. මෙම කාර්මික ආරාවුල උද්ගතවීමට හේතුව එම වගකීම පැහැර හැරීමයි. පැමිණිලිකරු කිසිඳු ප්‍රමාදයකින් තොරව 1997.03.01 දින තමන්ට සිදු වූ අසාධාරණය ඉවත් කර සහන ලබා ගැනීම සඳහා කටයුතු කර ඇති බවත් 2020.08.24 වන දින ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් ටී.එම්.ලංකාගේ මහතා අනුරූප නව තනතුරේ පිහිටු වීමට කටයුතු නොකිරීම නිසා පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර උද්ගත වූ කාර්මික ආරාවුල විසඳා ගැනීමට කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇත. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව

අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් මෙම ආරාවුල නිරවුල් කිරීමෙන් බේරුම් කිරීම සඳහා බේරුම්කරණය සඳහා යොමු කර ඇත.

ඒ අනුව පළමු පාර්ශ්වය වෙතින් සැළකිය යුතු තරමේ ප්‍රමාදයක් සිදු වී නොමැති බව පැහැදිලි වේ. මානව හිමිකම් කොමිෂම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 1997.03.01 දින සිට 2020.08.24 දක්වා මෙම ගැටලුව විසඳීම සඳහා කාලය ලබා ගෙන ඇත.

දෙවන පාර්ශ්වය පවසන පරිදි පළමු පාර්ශ්වය විසින් දීර්ඝ කාලයක් නිද්‍රාවේ සිට සාධාරණත්වය ලබා ගැනීම සඳහා කටයුතු කිරීමක් මෙහිදී සිදු වී නොමැති බව පැහැදිලිය.

දෙවන පාර්ශ්වයේ මීලඟ විරෝධතාවය වනුයේ පළමු පාර්ශ්වය විශ්‍රාම ලබා ඇති බැවින් සේවායෝජක හා පළමු පාර්ශ්වය අතර කාර්මික ආරාවුලක් පැවතිය නොහැකි බවයි. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 48 වගන්තියේ "සේවකයා" යන්න අර්ථ නිරූපණයේදී සේවය අවසන් කරනු ලැබ ඇති යම් තැනැත්තෙක්ද සේවකයා යන්නට ඇතුලත් බව දක්වා ඇත. තවද එම වගන්තියේ "කාර්මික ආරාවුල" යන්න අර්ථ නිරූපනයේදී සේවායෝජකයෙකු හා සේවකයෙකු අතර ඇති වන ආරාවුලක් හෝ මතභේදයක් ද ඊට අයත් වන බව දක්වා ඇත.

ඒ අනුව පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර කාර්මික ආරාවුලක් පවතින අතර පළමු පාර්ශ්වයේ විශ්‍රාම ප්‍රතිලාභවලට අදාළ සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ සහ සේවා නියුක්ති භාර අරමුදලේ ප්‍රතිලාභ කෙරෙහිද පාරිතෝෂික ප්‍රතිලාභ කෙරෙහි ද බලපාන්නා වූ කාර්මික ආරාවුලකි. මෙම විශ්‍රාම ප්‍රතිලාභ, වැටුප මත පදනම් වන බැවින් උසස් වීමකදී වැටුප වැඩි වන විට ඉහත ප්‍රතිලාභ ද වැඩි වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයට අනුව ටී. එම් ලංකාගේ මහතාගේ උසස්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් කළ යුතු යාවත් කාලීන කිරීමට පසුව පළමු පාර්ශ්වයට ලැබිය යුතු හිඟ වැටුප් සම්බන්ධයෙන් සාක්ෂි විභාගයේදී පළමු පාර්ශ්වය විසින් පී12 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ටී. එම්. ලංකාගේ මහතා විසින්ම පිළියෙළ කරන ලද ලේඛනය පිළිබඳ දෙවන පාර්ශ්වයේ නීතිඥ මහත්මිය විසින් හරස් ප්‍රශ්න අසන ලදී.

එම හරස් ප්‍රශ්නවලට පළමු පාර්ශ්වය විසින් පිළිතුරු දීමේදී එම ලේඛනයේ අඩංගු සමහර සටහන් යොදා ඇත්තේ ඇයි ද යන්න මතක නැති බව කියා සිටී. එමෙන්ම තමන්ට ගෙවීම් කර ඇති වැටුප් දැක්විය යුතු තීරු හිස්ව තබා ඇති බවත් එම හිස් තැන් තමා සම්පූර්ණ කර නැති බවත් කියා සිටී. ඊට හේතු දැක්වීමට ඔහු අසමත් වී ඇත.

ප්‍ර : දෙවන තීරුවේ මොකක්ද සඳහන් වෙන්නේ?

පි : සැලරි ස්කේල්.

ප්‍ර : මොන සැලරි ස්කේල්ද ?

පි : 93.03.01

ප්‍ර : හරස් අතටනේ?

පි : ඔව්.

ප්‍ර: තිරස් අතට 2006.10.19 කියලා තියෙන්නේ? මතක නැහැ?

පි : මතක නැහැ.

ප්‍ර : ඊළඟට?

පි : පඩි ටික දාලා තියෙන්නේ.

ප්‍ර : තුන්වන පේළියේ තමන් හදපු ලේඛනයේ දැන් එතැන තියෙනවා නේද 2005.12.31 මන්ත්ලි සැලරි කියලා තීරුවක්?

පි : ඔව්.

ප්‍ර : ඒ තීරුවට අදාළ පේඩ් කියන තැන මොකුත් සඳහන් වෙලා නැහැ නේද?

පි : නැහැ.

ප්‍ර : එතන ඉඳන් බේසික් සැලරි කියන තැනට යනකන් මොනවත් පුරවලා නැහැ නේද?

පි : පුරවලා නැහැ.

(2024.04.09 වන දින සාක්ෂි සටහන් පිටු අංක 17,18)

පළමු පාර්ශ්වය විසින් මෙම පී12 ලෙස ලකුණු කරන ලද ලේඛනය පළමු පාර්ශ්වයේ අවසන් ලිඛිත දේශනයේ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත්තේ එය කොටස්වලට කඩා තමන්ට අවශ්‍ය පරිදි කොටස් මාරු කර අලවා විකෘති කරන ලද ලේඛනයක් ලෙසිනි.

මේ අනුව පී12 ලේඛනයේ සඳහන් කිසිවක් ප්‍රදානය ලබා දීමේදී සලකා නොබැලීමට තීරණය කළෙමි.

**නිගමනය**

01. පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර 2020.08.24 දින හෝ ඊට ආසන්න දිනක කාර්මික ආරාවුලක් ඇති වී ඇත. ඊට හේතු වී ඇත්තේ පළමු පාර්ශ්වය හෙවත් පැමිණිලිකරු විශ්‍රාම යාමට පෙර පැමිණිලිකරු හා සේවායෝජක ආයතනය අතර වූ සේවා කොන්දේසි පිළිබඳ ප්‍රශ්නයක් නොව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පෙරදාතම කර උසස් කරන ලද තනතුරෙහි පිහිටුවීම නොකිරීම පිළිබඳ ප්‍රශ්නයකි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පැමිණිලිකරුගේ උසස්වීම ප්‍රමාද වී ලබා දීම පැමිණිලිකරුගේ දෝෂයක් නිසා නොව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රමාදය මත සිදුවීමකි.

03. මෙම උසස්වීම විශ්‍රාමිකයෙකුට ලබා දෙන උසස්වීමක් නොව ක්‍රියාකාරී සේවයේ යෙදී සිටියදී ලබා දිය යුතු වූ නමුත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රමාදය නිසා පැමිණිලිකරු විශ්‍රාම ලැබීමෙන් පසුව පෙරදාතම කර ලබා දුන් උසස්වීමකි.

04. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිසි පරිදි පළමු පාර්ශ්වයට රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ලබා දී ඇති උසස් කිරීම පිළිබඳ තොරතුරු ලබා දී තිබියදීත් දෙවන පාර්ශ්වය විසින් කළ යුතු යාවත්කාලීන කිරීම නොකර ඇත.

05. පළමු පාර්ශ්වය විසින් පී12 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති සහ උසස් වීමෙන් පසු පළමු පාර්ශ්වය වෙත ලැබිය යුතු හිඟ වැටුප් පිළිබඳ විස්තර අඩංගු එකී ලේඛනය ප්‍රදානය ලබා දීමේදී සැලකිල්ලට නොගෙන බැහැර කිරීමට තීරණය කරමි.

**ප්‍රදානය**

01. 1997.03.01 දින වන විට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අනුයුක්තව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ iii වන පන්තියේ සේවය කරමින් සිටි ටී.එම් ලංකාගේ මහතා එදින සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට ii ශ්‍රේණියේ කථිකාචාර්යවරයෙකු ලෙස අන්තර්ග්‍රහණය කර ඇත. පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ටී. එම් ලංකාගේ මහතා පිහිටුවා තිබූ ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ iii වන පන්තිය ලෙස පිහිටුවීම නිවැරදි නොවන බැවින් එම වරද නිවැරදි කරමින් 1993.07.01 දින සිට ශ්‍රී ලංකා කාර්මික සේවයේ ii වන පන්තියට උසස් කර එම පන්තියේ පිහිටුවා ඇත. ඒ අනුව 1997.03.01 දින වන විට ටී. එම්. ලංකාගේ මහතා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අනුයුක්තව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ii පන්තියේ කථිකාචාර්ය තනතුරේ හෙවත් නව උසස්වීමේ සිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තග්‍රහණය කළා සේ සළකා 1997.03.01 දින සිට i ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරේ පිහිටු විය යුතුය.

02. 1999.05.21 දින සිට ටී. එම්. ලංකාගේ මහතා ජොෂ්ඨ කථිකාචාර්ය ධූරයේ තවදුරටත් තැබීමට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් කටයුතු කළ යුතුය.

03. 1997.03.01 දින සිට 1999.05.20 දින දක්වා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ i වන ශ්‍රේණියේ කථිකාචාර්ය ධූරයට හිමි නියමිත අනුරූප වැටුප් පියවරේ පිහිටුවීමට නියම කරමි.

04. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය විසින් 1999.05.20 දින දක්වාම ටී.එම්.ලංකාගේ මහතාට 1 ශ්‍රේණියේ කථිකාචාර්ය ධූරය ලබා නොදීම නිසා ඒ මහතාට මූල්‍යමය වශයෙන් සිදුව ඇති අලාභය පහත ගණනය කර ඇත. එම ගණනය කිරීම සාධාරණ හා යුක්ති සහගත බව නිගමනය කරමි. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ කථිකාචාර්ය ධූරයන් සඳහා වූ වැටුප් පරිමාණයන් දක්වන ලේඛනය 2024.10.28 දින පැවති සාක්ෂි විභාගයේදී දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලදි. එම ලේඛනය x වශයෙන් ලකුණු කර මීට යා කර ඇත.

I . ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර : 162540 - 7 X5520 -201180

II. ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර : 124500 -7X4080-153060
ටී. එම්. ලංකාගේ කාර්මික අධ්‍යාපන සේවයේ මුල් පත්වීම් දිනය : 1989.09.01
මුල් පත්වීම ලැබූ තනතුර : 111 පන්තියේ කථිකාචාර්ය

III. පන්තියේ කථිකාචාර්ය තනතුරට උසස් කළ දිනය - 1993.07.01
1997.03.01 දින වන විට වැටුප් පියවර - 8

උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කළ දිනය : 1997.03.01

උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කළ තනතුර : 11 ශ්‍රේණියේ කථිකාචාර්ය

උසස් තාක්ෂණ ආයතනයට අන්තර්ග්‍රහණය කළ යුතුව තිබූ තනතුර : 1 ශ්‍රේණියේ කථිකාචාර්ය 1 හා ii ශ්‍රේණිවල කථිකාචාර්ය ධූරයට අදාළ වැටුප් පියවරයන්,

| පියවර | ii ශ්‍රේණිය | i ශ්‍රේණිය |
|---|---|---|
| 1 | 10375 | 13545 |
| 2 | 10715 | 14005 |
| 3 | 11055 | 14465 |
| 4 | 11395 | 14925 |
| 5 | 11735 | 15385 |
| 6 | 12075 | 15845 |
| 7 | 12415 | 16305 |
| 8 | 12755 | 16765 |
| 9 | 13095 | 17225 |
| 10 | 13435 | 17685 |

| කාලය | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ලබමින් සිටි වැටුප් පියවර | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන සේවයේ ලැබිය යුතු වැටුප් පියවර | උසස් අධ්‍යාපන ආයතනයේ වැටුප් | | වැටුපේ වෙනස |
|---|---|---|---|---|---|
| | | | 11 පන්තිය | 1 පන්තිය | |
| 1997.03.01 සිට 1998.03.01 දක්වා | 8 | 8 | 12755 | 16765 | 4010*12 = 48120 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1998.03.01 සිට 1999.03.01 දක්වා | 9 | 9 | 13095 | 17225 | 4130*12 = 49560 |
| 1999.03.01 සිට 1999.04.30 දක්වා | 10 | 10 | 13435 | 17685 | 4250* 2 = 8500 |
| 1999.05.01 සිට 1999.05.21 දක්වා | 10 | 10 | 13435 ÷ 30×20 8956.67 | 17685 ÷ 30×20 11790.00 | 2833.33*1 = 2833.33 |
| එකතුව | | | | | 109013.33 |

| | |
|---|---|
| ඒ අනුව 1997.03.01 සිට 1999.05.21 දක්වා හිඟ වැටුප = | 109013.33 |
| සේ.අ.අ.දායක මුදල් වෙනුවෙන් | 20102.67 |
| සේ.භා. ආ දායක මුදල් වෙනුවෙන් | 3015.40 |
| මුලු හිඟ මුදල | 132131.40 |

05. 1999.05.20 දිනට ලබමින් සිටි වැටුපට සාපේක්ෂව 1999.05.21 වෙනි දිනට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට උසස් වීම සළකා ඊට අදාළ වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පියවරේ තැබීමටත් එදින සිට 2011.09.27 දින (විශ්‍රාම ලැබූ දිනය) දක්වා අදාළ සියළු වැටුප් පරිවර්තනය කිරීම් කරමින් හිඟ වැටුප් ගෙවීමට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට නියම කරමි.

06. සංශෝධනය කරන ලද වැටුපට අනුව පාරිතෝෂික දීමනා මුදල ගණනය කර හිඟ පාරිතෝෂික දීමනා මුදල ගෙවීමට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් කටයුතු කළ යුතුය.

07. මෙම ප්‍රදානය රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දිනයේ සිට මාස 03 ක් ඇතුලත ඉහත1,2,3,4,5,6 ලෙස සඳහන් නියමයන් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කර ඒ බව තහවුරු කිරීමට අදාළ සියළු ලේඛන කම්කරු දෙපාර්තමේන්තුවේ මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු අතර ඉහත නියමයන් ඔහු මගින් ක්‍රියාත්මක කරවීමට සුදුසු පියවර ගත යුතුය.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් ගෙවිය යුතු බවට නියම කරන ලද සියළු හිඟ මුදල් ටී. එම්. ලංකාගේ මහතාට ගෙවීමට හැකි වන පරිදි මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට තීරණය කරමි.

**එම්.එම්. අයි.ආර්.ඒ.ජයතිලක,**
බේරුම්කරු.

2025 අගෝස්තු මස 13 වැනි දින.

E0G 09 - 0081

---

මගේ අංකය - IR/COM/04/2019/165

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.04 දිනැති හා අංක 2430/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.03.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොච්චිකඩේ, උතුරු පල්ලන්සේන, දූවන පල්ලිය පාර, 12/01 ලිපිනයෙහි පිහිටි ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය (බී. ඒ. පී. ගුණවර්ධන මයා වෙනුවෙන්) සහ 1. කොළඹ 05, කිරුළ පාර, අංක 200 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන

මණ්ඩලය 2. කල්මුණේ, නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/13/2025 හා 2025.08.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

## බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

ගොණු අංකය - IR/COM/04/2019/165
නඩු අංකය - A/13/2025

ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය,
(බී.ඒ.පී.ගුණවර්ධන මයා වෙනුවෙන්)
අංක 12/01, දූවන පල්ලිය පාර.
උතුරු පල්ලන්සේන,
කොච්චිකඩේ.

පළමු පාර්ශ්වය

සහ

1. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
   අංක 200,කිරුළ පාර,
   කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
   නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය,
   කල්මුණේ.

දෙවන පාර්ශ්වය

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
ස්වාධීන මෝටර් රථ සේවක සංගමයේ ලේකම් කේ. බී. ප්‍රසාද් ප්‍රනාන්දු මහතා.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ දිල්හානි රත්නායක මිය
ශානිකා ගාල්ලගේ මිය
ජ්‍යෙෂ්ඨ මානව සම්පත් නිලධාරී ඒ. පී. ගුණසිරි මයා
පරිපාලන නිලධාරී ග්‍රේටා රෝසස් මිය
නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කාර්මික සම්බන්ධතා) - දයාන් තුඩුගල මහතා

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල් එච්.කේ.කේ..ඒ. ජයසුන්දර මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/04/2019/165 හා 2025.03.18 දින ලිපියට අනුව ඉහත දැක්වෙන කාර්මික ආරාවුලට හේතුපාදක වී ඇත්තේ,

“ බී. ඒ. පී. ගුණවර්ධන මහතා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ත්‍රිකුණාමලය ඩිපෝවේ සේවය කළ කාල සීමාව තුළදී ලබා දෙනු ලැබූ ස්ථාන මාරුවීම හේතුවෙන් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ කාල සීමාව සඳහා (2018.10.09 දින සිට 2018.11.26 දින දක්වා) ඔහුට වැටුප් ලබාගැනීම සඳහා හිමිකමක් තිබේද යන්නත් එසේ හිමිකමක් තිබේ නම් ඔහුට වැටුප් ලබා නොදීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් එහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.”

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/07/2024 හා A/13/2025 යටතේ බේරුම්කරණ අංශයට දෙපාර්ශ්වය කැඳවා විභාග පවත්වා ඇත.

2024.03.22
2024.06.24
2024.07.12
2024.08.13
2025.04.22
2025.04.29
2025.05.21
2025.05.27
2025.06.12
2025.06.17
2025.06.25
2025.07.15

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත් වූ ආකාරය**

මෙම නඩුව A/07/2024 යටතේ පවත්වා ගෙන ගොස් එම නඩුවේ සඳහන් තොරතුරු අනුව ඉදිරියටත් පවත්වා ගැනීමට දෙපාර්ශ්වයේම එකඟතාවය පළ කළ අතර ඒ අනුව නඩුව පවත්වාගෙන ගොස් ඇත.

ඉල්ලුම්කරු වන බී. ඒ. පී. ගුණවර්ධන මහතා 2015 සිට 2018 වනතුරු ත්‍රිකුණාමල ශ්‍රී ලංගම ඩිපෝවේ සේවය කළ බව 2025.04.22 අධිකරණයට සාක්ෂි දෙමින් පවසා ඇත.( පිටු අංක 24). එමෙන්ම 2018.10.19-2018.11.26 දක්වා වැටුප් ලබා ගැනීමට නොහැකි වීම පිළිබඳව ගැටළුවක් ඇති බව ප්‍රකාශ කර ඇත.මෙම ආරාවුලට හේතු වී ඇත්තේ එම කරුණ බව පෙනී යයි.

මෙයට හේතු වූ කරුණු විමර්ශණයේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

ඉල්ලුම්කරු v වන ශ්‍රේණියේ විධායක ශ්‍රේණියට අයත් වන අතර ත්‍රිකුණාමල ඩිපෝවේ සේවය කරමින් සිටින විට 2018.10.08 දිනැති නැගෙනහිර ප්‍රධාන ප්‍රාදේශීය කාර්යාලයට තාවකාලිකව අනුයුක්ත කිරීම මැයින් ලිපියක් නිකුත් කිරීමයි. එම ලිපිය දෙවන පාර්ශ්වය විසින් R 2 වශයෙන් ලකුණු කර ඇත.

පළමු වන පාර්ශ්වය කියා සිටින්නේ එසේ ස්ථාන මාරු කිරීමට ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසයේ 18 චක්‍රලේඛය පරිදි ප්‍රාදේශීය කළමනාකරුට බලයක් නොමැති බවයි.

එමෙන්ම 2025.05.21 කාර්මික අධිකරණයට සාක්ෂි ලබා දුන් නියෝජ්‍ය මානව සම්පත් (කාර්මික සම්බන්ධතා) දයාන් තුඩුගල මහතා බේරුම්කරණයේ දී ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් -

ප්‍ර : එතකොට විධායක නිලධාරියෙක් මාරු කරන්න බලයක් තියෙනවාද? ප්‍රාදේශීය කළමනාකරුට මෙම චක්‍රලේඛණය අනුව

පි : මේ චක්‍රලේඛණය අනුව නැහැ. (පිටු අංකය 09)

බේරුම්කරු

ප්‍ර : කවුද අනියුක්ත කළේ?

පි : ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු

ප්‍ර : දැන් මේ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ මේ දක්වා අනුමැතියක් ලැබී නැහැ.

පි : නැහැ. (පිටු අංකය 27)

පළමු පාර්ශ්වයේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පහත පිළිතුරු සපයා ඇත.

ප්‍ර : දැනට A 4 චක්‍රලේඛය වලංගුද?

පි : වලංගුයි

ප්‍ර : මෙම චක්‍ර ලිපියට අනුව 2015.10.05 වන දිනයෙන් පසුව ප්‍රධාන මානව සම්පත් කළමනාකාරට හැර වෙනත් අයට ස්ථාන මාරු කිරීමේ හෝ අනුයුක්ත කිරීමේ බලයක් තිබෙනවාද?

පි : නැහැ.

ප්‍ර : මම අහන්නේ ප්‍රාදේශීය කළමනාකාර තැන මෙම ඉල්ලුම්කරුට සේවයේ අනුයුක්ත කිරීම චක්‍ර ලිපිවලට පටහැනිද නැද්ද?

පි : චක්‍ර ලිපිය අනුව පටහැනියි.

ප්‍ර : ලොග් සටහන් තබා තිබෙන්නේ කවුද?

පි : ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු

ප්‍ර : එය සභාපතිතුමා අනුමත කර තිබෙනවාද?

පි : ලොග් සටහන් පත්‍රයේ අනුමැතියක් සටහන් කර නැහැ.

ප්‍ර : අනුමැතිය ලබා දී තිබෙනවාද?

පි : නැහැ. (පිටු අංක 07- 8) 2025.05.27

ප්‍ර : අද වෙනකන් අනුමැතියන් දිලා තියෙනවාද?

පි : නැහැ

බේරුම්කරු සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර සිටී

ප්‍ර : ලොග් සටහනේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් යම්කිසි අනුමැතියක් ලැබිලා තියෙනවාද මේ දක්වා?

පි : :නැහැ.

එමෙන්ම ප්‍රාදේශීය කළමනාකරු වන විජිත ධර්මසේන මහතා 2025.06.12 අධිකරණයේ සාක්ෂි දෙමින්

ප්‍ර : 2018.05.09 සිට මාස කීයක් නිකන් හිටියාද?

පි : මාස 04 ක් දළ වශයෙන්

ප්‍ර : ත්‍රිකුණාමල ඩිපෝවේ හිටියා වැඩක් කරන්නේ නැතුව ඔය විදිහට වැටුප් ගෙවන්න පුලුවන්ද?

පි : ගෙවන්න අපහසුයි. නමුත් ගෙව්වා.

ඉල්ලුම්කරු 2025.06.17 බේරුම්කරණයේ ප්‍රශ්නවලට සාක්ෂි දෙමින්

ප්‍ර : ඒ අතරතුර කොහාටවත් සේවයට වාර්තා කළේ නැද්ද?

පි : නැහැ ස්වාමිණි. අභියාචනයේ පිළිතුරු එනතුරු සිටියේ.

ප්‍ර : කොහෙද හිටියේ?

පි : ප්‍රධාන කාර්යාලයට ඇවිල්ලා ඒ සඳහා පිළිතුරු ලබා ගැනීමට කාලයක් ගත වුණා. ඒ කාලය තමයි මේ. ඉන් පසුව ස්ථාන මාරුවක් ලබා දුන්නා දියසෙන්පුර ඩිපෝවට, ඉන්පසු එහෙ සේවයට වාර්තා කළා. (පිටු අංක 83)

ප්‍ර : සභාපතිතුමා මොහු සේවයේ යෙදී සිටියා සේ සලකා ද ස්ථාන මාරුව ලබා දුන්නේ?

පි : සේවයේ යෙදී සිටියා සේ සලකා ස්ථාන මාරුව ලබා දුන්නා. (පිටු අංක 19)

**නිගමන හා නිර්දේශයන්**

නැගෙනහිර ප්‍රාදේශීය කළමණාකරු වශයෙන් සේවය කළ විජිත ධර්මසේන මහතා තමාට නොමැති බලයක් පාවිච්චි කරමින් ඉල්ලුම්කරු කල්මුනේට ස්ථාන මාරු කිරීම් කිරීම ඔහු තම බලය අවභාවිතා කළ බවට නිගමනය කරයි. ඔහුට මෙම ස්ථාන මාරු වීම කිරීමට සභාපතිතුමා විසින් දුරකථනයෙන් උපදෙස් දුන් බව සඳහන් කළත් එය සභාපතිතුමා විසින් මේ දක්වා අනුමත කර නොමැති බව පෙනී යයි.

එමෙන්ම මෙම ස්ථාන මාරු වීම ප්‍රධාන මානව සම්පත් කළමණාකරු විසින් ඔහුගේ අංක ශ්‍රී ලංගම/මාශප/ස්ථාන මාරු/විධා/46/2018 හා 2019.11.26 ලිපියෙන් කල්මුනේ ප්‍රාදේශීය කාර්යාලයට ලබා දුන් ස්ථාන මාරු වීම අවලංගු කර ඇත. (A 5 - පිටු අංක 18) තවද ප්‍රධාන මානව සම්පත් කළමණාකාර විසින් ඔහුගේ අංක දරන 2015.10.05 ලිපිය මගින් ස්ථාන මාරුවීම් හා අනියුක්තකිරීම තාවකාලිකව නතර කරන ලෙස දැනුම් දී ඇත.(පිටු අංක 14-A4)

තවද 2024.03.19 දින හා පොළොන්නරුව ඩිපෝවේ සහකාර කළමණාකාර මුදල් විසින් කාර්ය භාර නිළධාරීතුමා වෙත දන්වා ඇති පරිදි,

2018 ඔක්තෝබර් මාසය සඳහා රු.39462.00 හා 2018 නොවැම්බර් මාසය සඳහා රු.39462.00 ඉල්ලුම්කරුට නොගෙවූ වැටුප් වශයෙන් සඳහන් කර ඇත. මෙම මුදල ඉල්ලුම්කරුට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදලක් බවට නිශ්චය කර නිගමනය කරමි. තවද එම කාල සීමාවට අදාළ සියළුලු වරප්‍රසාද ඉල්ලුම්කරුට හිමි බවට නිගමනය කරමි.

මෙම ස්ථාන මාරු වීම තුළින් ඉල්ලුම්කරුට වැටුප් නොගෙවීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බවට නිශ්චය කර නිගමනය කරමි.

**ප්‍රදානය**

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහලින්ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණ නිගමනයක් වශයෙන් ඉල්ලුම්කරු වන දැනටමත් පොළොන්නරුව ඩිපෝවේ ඩිපෝ අධිකාරි වශයෙන් සේවය කරන V වන ශ්‍රේණියේ බී. ඒ. පී. ගුණවර්ධන මහතාට 2018

ඔක්තෝබර් සහ 2018 නොවැම්බර් යන මාස සඳහා නොගෙවූ වැටුප වන රු:78924.00(හැත්තෑ අට දහස් නවසිය විසි හතර) ක මුදල,

මෙම ප්‍රදානය ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ වී මසක් ඇතුළත බී. ඒ. පී. ගුණවර්ධන මහතාට ගෙවීමට කටයුතු කරන ලෙසට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාට නියම කරමි. ඒ බව නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කරන මෙන් නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**ඒ. බී. හේරත්,**
බේරුම්කරු.

2025 අගෝස්තු මස 13 වැනි දින.

E0G 09-0082

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.